ඉන්ධන හිඟය හා ඉන්ධන මිල ඉහළ දැමීම සමඟින් අප්‍රේල් 19, 2022 දින රඹුක්කනදී පැවැත්වුණු විරෝධතාවයත්, ඉන් පසු ඇතිවූ නොසන්සුන් තත්වයත්, පොලිසිය මගින් විරෝධතාකරුවන්ට ප්‍රහාර එල්ල කිරීමත් සම්බන්ධයෙන්, මෙම දින කිහිපය පුරාවටම මාධ්‍ය අවධානය යොමුව තිබූ අතර, බොහෝ පුවත්පත් කතුවැකි තුළද එම සිදුවීම පිළිබඳ අදහස් හා පසුවිපරම් කිරීම් දක්නට ලැබිණි.

අප්‍රේල් 21, 2022 දින දිනමිණ හා අරුණ පුවත්පත් කතුවැකි ඊට උදාහරණ ලෙසින් ගත හැක. මෙම කතුවැකි දෙක තුළ ගැබ්වූ තොරතුරු සහ රාමුගත කිරීම් මෙසේයි.

දිනමිණ: "විරෝධතා හොඳයි! අපරාධ නරකයි!"

පොලිසිය මැදිහත් වී "කැරලිකරුවන්" පලවා හැර, ඇතැම් විට රඹුක්කනම ගිනිගෙන ජීවිත හානි ගණනාවක් සිදුවීම වළක්වා ඇත. දැන් කළ යුත්තේ රඹුක්කන ගැටුමේ වැරදිකාරයින් ගැන කතා කිරීම නොව තවත් මෙබඳු සිදුවීම් ඇති වීමට ඇති ඉඩ නැති කිරීමයි.

අරුණ: "ආර්ථික පීඩනයට වෙඩි ප්‍රහාරයක්"

වැදගත් වන්නේ, "විරෝධතාකරුවන්ට" වෙඩි තැබීම සම්බන්ධ සිදුවීම සඳහා පරීක්ෂණ කණ්ඩායම් පත් කිරීම නොව, එකී පරීක්ෂණ විනිවිදභාවයකින් හා විශ්වසනීය ආකාරයකට පැවැත්වීමයි.

ඔබ තෝරාගන්නේ කුමන පුවත්පත් කතුවැකිය ද?